මුදල් අමාත්‍ය කාර්යාලය
நிதி அமைச்சரின் அலுவலகம்
FINANCE MINISTER'S OFFICE

මුදල් අමාත්‍ය මාධ්‍ය අංශය,
මහලේකම් කාර්යාලය, කොළඹ 01
நிதி அமைச்சின் ஊடகப் பிரிவு ஊடகப் பிரிவு,
நிதி அமைச்சகம், கொழும்பு 01
Finance Minister's Media Division,
The Secretariat, Colombo 01

| මාධ්‍ය නිවේදනය | செய்தி வெளியீடு | PRESS RELEASE |
|---|---|---|

මාධ්‍ය නිවේදන අංක - 103 දිනය - 2020 – 11 - 29

# "සපිරි ගමක්" ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන රුපියල් මිලියන 15,000ක් වටිනා ව්‍යාපෘති 20,117ක් ජනතා අයිතියට පත්කොට අවසන්

ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සහ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීමේ අරමුණෙන් ක්‍රියාත්මක "සපිරි ගමක්" ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ඔක්තෝබර් මස 31 වැනිදා වන විට මේ වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 37,000 අතරින් ව්‍යාපෘති 20,117ක වැඩ අවසන් කර ජනතාව වෙත ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කර ඇත. එම ව්‍යාපෘතිවල වටිනාකම රුපියල් මිලියන 15,000කි.

ගම සහ නගරය එකිනෙක යා කිරීම මගින් ග්‍රාමීය වෙළෙඳපොළ නගරය හා එක් කිරීමේ අරමුණෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහනේ ප්‍රධාන ස්ථානයක් හිමිව ඇත්තේ නව ග්‍රාමීය මාර්ග ඉදිකිරීම සහ අලුත්වැඩියාව සඳහා ය.

මෙම වැඩසටහන යටතේ නව ඉදිකිරීම් සහ අබලන් වූ මාර්ග පිළිසකර කිරීම් ඇතුළත්ව ජනතාවට හිමි වී ඇති සමස්ත මාර්ග කිලෝමීටර් සංඛ්‍යාව 2,915කි. එම මාර්ග පද්ධති හා සම්බන්ධ වී ඇති බෝක්කු 362ක් අලුතින් ඉදිකර ඇති අතර නවීකරණය කරන ලද බෝක්කු සංඛ්‍යාව 82කි. මීට අමතරව අලුතෙන් ඉදි කළ සහ නවීකරණය කරන ලද ග්‍රාමීය පාලම් 50ක් ද මෙම වැඩසටහන යටතේ ජනතා අයිතියට පත්ව තිබේ.


ස්වයං රැකියා වැඩිදියුණු කිරිම පෙර දැරිව සති පොළ හා ග්‍රාමීය වෙළඳ මධ්‍යස්ථාන 22 ක් ද, කෘෂි ගබඩා 59 ක් ද කෘෂිකර්මයට සෘජුවම දායක වන කෘෂි ඵලදාව වර්ධනය සඳහා ඉවහල් වන කෘෂි ළිං ව්‍යාපෘති 14ක් ද අවසන් කර තිබේ. මීට අමතරව ජලඅපවහන සහ කානු පද්ධති කිලෝමීටර් 399ක්, සුළු වාරි ව්‍යාපෘති නව ඉදි කිරීම් 28ක් ද සපිරි ගමක් ව්‍යාපෘතිය යටතේ ජනතාවට හිමිව තිබේ.

ග්‍රාමීය ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීම හා ජලය ආශ්‍රිත රෝග නිවාරණය පදනම් කර ගනිමින් නිම කර ඇති පානීය ජල ව්‍යාපෘති සංඛ්‍යාව 183 කි. තවද ග්‍රාමීය ජනතාවගේ පෝෂණය හා අධ්‍යාපන තත්වයන් පදනම් කර ගනිමින් ජනතා අයිතියට පත්ව ඇති සෞඛ්‍ය මධ්‍යස්ථාන හා පාසැල් සනීපාරක්ෂක ව්‍යාපෘති 179 කි.

මේ යටතේ එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් වෙනුවෙන් රුපියල් මිලියන 2ක් වෙන් කර ඇති අතර මෙහි දී පසුගිය වසර කිහිපය තුළ අවධානය යොමු නොවූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ මග පෙන්වීම යටතේ, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් මත ක්‍රියාත්මක "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ගම සංවර්ධනය තුළින් ප්‍රාදේශීය මට්ටමේ විෂමතා අවම කරමින් ජනතාව මුල් කරගත් ආර්ථිකයක් බිහි කිරීම අපේක්ෂා කෙරේ.

හුදකලා වූ ගම නගරය හා සම්බන්ධ කිරීමත් ඒ තුළින් මුළු රටම තනි ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමෙන් පහසුකම් සපිරි ජීවන මධ්‍යස්ථානයක් බවට ගම පත් කිරීම මෙහි අරමුණයි. ගම තුළ ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව සෑදූම් ලත් කමිටුවක් මගින් මූලිකව හඳුනාගනු ලබන ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය හා සමාජ ආර්ථික තත්වය නන්වාලීමට ඉවහල් වන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ස්වයං රැකියා ජනනය කිරීම, කාන්තා හා තරුණ ශ්‍රමය ආර්ථික වර්ධනය සඳහා සෘජුවම දායක කර ගැනීම ද මෙහි ඉලක්ක අතර වේ.



අසේල බණ්ඩාරනායක,
ගරු මුදල් අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්


දුරකතන/ தொலைபேசி/ Telephone I ෆැක්ස්/ தொலைநகல்/ Fax I විද්‍යුත් තැපැල/ மின்னஞ்சல்/ E- Mail
011-2484600 011-2422507 mofmedia19@gmail.com